# ගොවි අදහස්

ගොවිකම් සඟරාවේ ගොවි අදහස් තීරයට පහත සඳහන් විමසීම් හා ප්‍රශ්න ලැබී ඇත. ලැබී ඇති සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට අවකාශ මඳ බැවින්, එයින් වැදගත් සමහරකට පිළිතුරු සැපයීමට බලාපොරොත්තු වෙමු.

**හොරණ, ජයසූරිය මාවතේ ඩබ්ලිව්. ඒ. සී. පෙරේරා මෙනෙවිය මෙසේ අසයි.**

ගොවිකම් සඟරාවේ පළකිරීමට එවනු ලබන රචනා, ලිපි ආදිය පැහැදිලිව තීන්තෙන් ලියා එවීම ප්‍රමාණවත්ද? ඒ රචනා යතුරුලිවීමෙන් පමණක්ම එවිය යුතුදැයි දැනගනු කැමැත්තෙමි.

උ. පැහැදිලිව ලියා එවීම ප්‍රමාණවත්ය.

**ඒ. පියසීලි සිල්වා මහත්මිය මෙසේ අසයි.**

බණ්ඩක්කා ගස්වල මල් නැගෙන කාලයේදී කොළ කහපාට වී, කරටි තීන් වී මැරී යන රෝගය වළක්වා ගන්නේ කෙසේද?

උ. ඔබ දක්වා ඇත්තේ බණ්ඩක්කාවලට වැළඳෙන විචිත්‍ර වෛවර්ණ රෝගයයි. වයිරස් මගින් මේ රෝගය බෝවේ. නොයෙක් වල් පැළෑටිවල සිටින සුදු පැහැති මැස්සන් වර්ගයක් නිසා රෝගය පැතිරේ. එහෙයින් වගාවේ ඇති වල් පැළෑටි විනාශකිරීම ඉතා වැදගත් වන්නේ රෝගය බෝවූ විට ප්‍රතිකාර නොමැති නිසායි. රෝගී පැළ වහාම ඉවත්කොට පුළුස්සා දමන්න. රෝගය ඉතිරි ගස්වලට ද පැතිර යාම මෙයින් නවතී.

**පිළියන්දල, දැල්තර, පන්සල පාරේ එන්. සී. පෙරේරා මහතා මෙසේ අසයි.**

භූමි තෙලෙන් ක්‍රියා කරන ඉන්කියුබේටරයක් මා සතුව ඇත. නමුත් මා එය පාවිච්චි කරණ ක්‍රමය නොදන්නෙමි. විශේෂයෙන්ම මට දැනගැනීමට අවශ්‍යව ඇත්තේ ඉන්කියුබේටරය ක්‍රියා කරන අවස්ථාවේ තර්මෝමීටරයෙහි තිබියයුතු උෂ්ණත්ව ප්‍රමාණයයි.

උ. උෂ්ණත්වය අංශක 103ක් වියයුතුය. බිත්තර රක්නය පිළිබඳ වැඩි විස්තර ගොවිකම් සඟරාවේ 1967 ජූලි-සැප්තැම්බර් කලාපයේ, "බිත්තර රැකීම පිළිබඳ උපදෙස්" යන මැයින් ලියා ඇති ලිපියේ සඳහන්කර ඇත.

**මතුගම, බොපිටියේ, කේ. ඩී. ගුණසේන මහතා මෙසේ අසයි.**

අද දේශපාලන පක්ෂ වෙනුවෙන්, රජයේ ඒ ඒ අංශවල නිලධාරීන් වෙනුවෙන් අඩුපාඩු සපුරාලීම් වස් ප්‍රවෘත්ති පත්‍රයක් බැගින් ඇත. නමුත් ගොවියාගේ අඩුපාඩු සපුරාලීමට කිසිදු මාර්ගයක් නොමැති හෙයින් ගොවියන් වෙනුවෙන් "ගොවියා" නමින් පුවත්පතක් ඇතිවුවහොත් යහපතැයි මම යෝජනා කරමි.

උ. ගොවිකම් සඟරාව එම අඩුපාඩුව පිරිමසාලයි.

**National Digitization Project**

***National Science Foundation***

Institute : Department of Agriculture

1. Place of Scanning : Department of Agriculture, Peradeniya
2. Date Scanned : ........2018./..1../..8..........................................................
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. <u>Scanning Officer</u>

Name : .........G...E...D.....Dilshan.................................................

Signature : ..................................................................................

<u>Certification of Scanning</u>

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

<u>Certifying Officer</u>

Designation : Chief.....Librarian..............................................

Name : Saumya....Upamalika..............................................

Signature : ..................................................................................

Date : ........2018./..1../.8............

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*